**වායු විමෝචන පරීක්ෂණ භාරකාර අරමුදල - 2017**

**--------------------------------------------------------**

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වායු විමෝචන පරීක්ෂණ භාරකාර අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2008 අංක 01 දරන මෝටර් වාහන වායු විමෝචන පාලනය කිරීම් නියෝග යටතේ, 2009 දෙසැම්බර් 29 දින එළඹ ඇති වායු විමෝචන පරීක්ෂණ භාර ඔප්පුවේ 9 (ඇ) ඡේදය සහ 2009 අංක 8 දරන මෝටර් වාහන පනත මගින් සංශෝධිත මෝටර් වාහන පනතේ (203 අධිකාරය) 29 (ආ) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. අරමුදලේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**-------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 මතය

-------

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට වායු විමෝචන පරීක්ෂණ භාරකාර අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-------------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාර බිල්පත් විකිණීමෙන් ලද රු.405,852,746 ක මුදල සහ වර්ෂය තුල මිලදීගත් රු.10,966,964 ක්වූ භාණ්ඩාගාර බිල්පත් වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුල ආයෝජන ක්‍රියාකාරකම් යටතේ වෙන් වෙන්ව දැක්විය යුතු වුවත් එම වටිනාකම් එකිනෙකට හිලව්කර ශුද්ධ අගය වූ රු.394,885,782 ක මුදල පමණක් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.187,356,003 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.197,173,302 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.9,817,299 ක පිරිහීමක් විය. පසුගිය වර්ෂයට සාපේක්ෂව වායු විමෝචන ගාස්තු ආදායම රු.7,086,755 කින් වැඩි වුවද නඩත්තු වියදම් රු.2,980,381 කින් හා අනිකුත් මෙහෙයුම් වියදම් රු.10,574,362 කින් වැඩිවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ රු.171,131,419 ක අතිරික්තය විචලනයන් සහිතව 2017 වර්ෂය වනවිට රු.187,356,003 ක් දක්වා වර්ධනය වී තිබුණි. එසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් නැවත ගැලපීමෙන් පසු 2013 වර්ෂයේදී රු.185,139,458 ක් වූ දායකත්වය විචලනයන් සහිතව වර්ධනය වී සමාලෝචිත වර්ෂය අවසානයට රු.214,531,051 ක් දක්වා වැඩි වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

--------------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ ක්ෂණික අනුපාතය 29:1 ක් වූ අතර එය ඉකුත් වර්ෂයේදී 1,131:1 වූයෙන් ඉතා ඉහල කාරක ප්‍රාග්ධනයක් පවත්වාගෙන ගොස් තිබූ බව නිරීක්ෂණය විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

### 4.1.1 සැලසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුදලේ දැක්ම, මෙහෙවර සහ අරමුණු ඉටු කර ගැනීම සඳහා වර්ෂ 03 කට නොඅඩු කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ආ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණ ද එහි පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) අපේක්ෂිත ප්‍රධාන කාර්යයන් ඉටු කෙරෙන ආකාරයට ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණු අතර ප්‍රධාන කාර්යයන් 05 ක් පමණක් එහි ඇතුලත් කර තිබුණි.

(ii) ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් කරුණු බොහොමයක් ක්‍රියාත්මක මට්ටමේ නොවූ අතර බොහොමයක් ක්‍රියාකාරකම් වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එමින් පැවති ඒවා විය.

### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වායු දූෂණය සිදු වී ඇති ක්ෂේත්‍ර හා ප්‍රදේශ හඳුනාගැනීමට අරමුදල විසින් "මහනුවර ප්‍රදේශයේ සංසරණ වායු තත්වය මැනීම සහ ආදර්ශ ආකෘති නිර්මාණය කිරීම සඳහා වූ ව්‍යාපෘතිය", "රථවාහන ආශ්‍රිත වායු දූෂණය හා බැඳුනු සෞඛ්‍ය මට්ටම ඇගයීම සඳහා කොළඹ නගර සභාවට අයත් පාසල් කේන්ද්‍ර කර ගනිමින් සිදු කරනු ලබන සිද්ධි අධ්‍යනය ව්‍යාපෘතිය"වැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබූ නමුත් සෞඛ්‍ය අවදානම අඩුකිරීමෙන් මහජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීමට සුදුසු වන පරිදි වායු තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාකාරකම් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වී තිබුණි.

(ආ) අරමුදලේ කටයුතු පවත්වාගෙන යාම සඳහා සම්බන්ධ කරගත යුතු පාර්ශවයන් පිළිබඳ අරමුදලේ භාරකාර ඔප්පුවේ නිශ්චිතව සඳහන් කර තිබුණ ද එවැනි පාර්ශවයන්ගේ සහභාගීත්වයකින් තොරව විවිධ ආයතන සමග ඇති කරගත් එකඟතා අනුව පමණක් අරමුදලේ කටයුතු මෙහෙයවා තිබූ බව නිරීක්ෂණය විය. මෙම හේතුව නිසා අරමුදල විසින් මේ දක්වා ක්‍රියාත්මක කර ඇති විවිධ ව්‍යාපෘතීන්වල කටයුතු නිසි පරිදි ඇගයීමකට, සමීක්ෂණයකට හෝ සමාලෝචනයකට භාජනය වී නොතිබුණි.

(ඇ) වාහන කළමනාකරණය සඳහා පහසුකම් සැපයීම සහ වැඩි දියුණු කිරීම අරමුදලේ අරමුණක් වුවද සමාලෝචිත වර්ෂය තුළ ඒ සඳහා සුදුසු වැඩ පිළිවෙලක් ක්‍රියාවට නංවා ඇති බවක් නිරීක්ෂණය නොවීය.

(ඇ) දුම් සහතික නිකුත් කරන ආයතනවල කටයුතු පිළිබඳව සොයාබැලීමට ප්‍රමාණවත් වැඩ පිළිවෙලක් අරමුදල විසින් සමාලෝචිත වර්ෂයේ දී ක්‍රියාත්මක කර නොතිබුණු අතර දිවයිනේ පැවති මුළු වායු විමෝචන පරීක්ෂණ මධ්‍යස්ථාන 384 න් 83 ක් හෙවත් සියයට 22 ක ප්‍රමාණයක් පමණක් සමාලෝචිත වර්ෂයේ දී අරමුදල මගින් පරීක්ෂා කර තිබුණි.

(ඉ) වායු විමෝචන පරීක්ෂණ සිදු කරන පුද්ගලික ආයතන 02 විසින් සමාලෝචිත වර්ෂයේදී වාහන 4,545,537 ක් සඳහා දුම් සහතික නිකුත් කර තිබුණද නමුත් අරමුදල මගින් මාර්ගස්ථ පරීක්ෂණ සිදුකර පැවතියේ එහි දුම් සහතික නිකුත් කල වාහන වලින් වාහන 3971 ක් පමණක් විය. එය නිකුත් කර ඇති දුම් සහතික වලින් සියයට 0.09 ක් වැනි ඉතා අඩු අගයක් විය.

(ඊ) අරමුදල මගින් මාර්ගස්ථ දුම් පරීක්ෂාවට ලක්කර තිබූ වාහන 3971 කින් වාහන 1425 ක්ම අදාළ ප්‍රමිත තත්ත්වයෙන් තොර බව හඳුනාගෙන තිබුණි. අදාල වාහනවල සමාලෝචිත වර්ෂයේ ආදායම් බලපත්‍රය පමණක් වායු විමෝචන පරීක්ෂණ භාරකාර අරමුදල මගින් රඳවාගෙන වාහන නිදහස් කර තිබුණි. එලෙස රඳවාගත් බලපත්‍ර පිළිබඳ විස්තර බලපත්‍ර නිකුත් කරන ආයතනය වෙත දැනුම් දී නොතිබීම හේතුවෙන් අවිධිමත් ලෙස නැවත ආදායම් බලපත්‍ර ලබාගැනීමට ඉඩ ප්‍රස්ථා පවතින බව නිරීක්ෂණය විය.

## 4.2 කාර්ය මණ්ඩල පරිපාලනය

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නිලධාරීන් 47 දෙනෙකුගෙන් යුක්ත කාර්යමණ්ඩලයක් භාණ්ඩාගාරයේ කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර තිබුණද එම කාර්යමණ්ඩලය විධිමත් පරිදි බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අරමුදලේ කටයුතු කරගෙන යාම සඳහා උපරිම සේවා කාලය වර්ෂ දෙකක් වන පරිදි කොන්ත්‍රාත් පදනම මත 2011 වර්ෂයේ සිට 19 දෙනෙකු බඳවා ගෙන තිබුණි. වසර දෙකක සේවා කාලය අවසානයේදී එම නිලධාරීන්ම නැවත කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබුණු අතර එකම නිලධාරීන් කණ්ඩායම වසර දෙකින් දෙකට කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන සමාලෝචිත වර්ෂයේදී රු.10,944,272 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි. තවද එම කාර්ය මණ්ඩලය සඳහා 1983 අංක 12 දරණ පාරිතෝෂිත ගෙවීම් (සංශෝධිත) පනත ප්‍රකාරව හිමිවිය යුතු පාරිතෝෂිත දීමනාවලටද හිමිකම් පෑමේ අවස්ථාවක් නොලැබෙන බව නිරීක්ෂණය විය.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---------------------------------------

## 5.1 අභ්‍යන්තර විගණනය

-------------------------

අරමුදල වෙනුවෙන් වෙනම අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබූ අතර දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය විසින් ද ප්‍රමාණවත් විගණනයක් සිදුකර නොතිබුණි.

## 5.2 ප්‍රමාද වූ ව්‍යාපෘති

--------------------

මහනුවර ප්‍රදේශයේ සංසරණ වායු තත්ත්වය මැනීම සහ ආදර්ශ ආකෘති නිර්මාණය කිරීම සඳහා වූ ව්‍යාපෘතිය වෙනුවෙන් පේරාදෙණිය විශ්වවිද්‍යාලය සමඟ රු.16,195,000 ක සේවා ගිවිසුමකට 2015 දෙසැම්බර් 02 දින එළඹ තිබූ අතර එම මුදලින් රු.8,000,000 ක් 2015 වර්ෂය තුළදී සහ රු.8,000,000 ක් 2017 වර්ෂය තුළදී විශ්වවිද්‍යාලය වෙත ගෙවා තිබුණි. ගිවිසුමට අනුව 2017 ජනවාරි 05 දිනෙන් එම ව්‍යාපෘතිය අවසන් විය යුතු වුවත් විශ්වවිද්‍යාලය විසින් සිදු කර තිබූ ඉල්ලීමක් පරිදි ගිවිසුම 2017 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි. කෙසේවුවද විගණිත දිනය වූ 2018 මැයි 24 වනතෙක් අවසන් ව්‍යාපෘති වාර්තාව සැපයීමට අදාළ විශ්වවිද්‍යාලය අපොහොසත් වී තිබුණි.

**5.3 අයවැය පාලනය**

---------------------

වැය විෂයයන් 5 ක් සඳහා රු. මිලියන 191 ක් ප්‍රතිපාදනය කර තිබුණද තත්‍ය වියදම රු.මිලියන 60 ක් හෙවත් මුළු ප්‍රතිපාදනයෙන් සියයට 31 ක් පමණක් විය. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගෙන නොමැති බව නිරීක්ෂණය විය.

**6. පද්ධති හා පාලනයන්**

-------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතාවයන් වරින්වර ආයතනයේ කොමසාරිස් ජනරාල්වරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|
| (අ) අයවැය පාලනය | අයවැයගත වියදම් සහ තත්‍ය වියදම් අතර විශාල වෙනසක් පැවතීම |
| (ආ) කාර්යය මණ්ඩල පරිපාලනය | අරමුදලේ කටයුතු මෙහෙයවීම සඳහා ප්‍රමාණවත් සුදුසුකම් සහිත කාර්යය මණ්ඩලයක් නොපැවතීම |
| (ඇ) වායු විමෝචන පරීක්ෂාව | මුළු දිවයිනම ආවරණය වන පරිදි වායු විමෝචන කටයුතු පිළිබඳ මාර්ගස්ථ පරීක්ෂණ ක්‍රියාවලියක් හඳුන්වා දී නොතිබීම. |